(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 32.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2009 ඔක්තෝබර් මස 08 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0125/'09

1.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සේවකයින්ට ඉඩම් මිලදී ගැනීම හා නිවාස ඉදිකර ගැනීම සඳහා සහනදායී පොලී මත ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේනම්, මෙම ණය යෝජනා ක්‍රමය යටතේ කොපමණ ණය මුදලක් ලබා දී තිබේද;

(iii) මේ යටතේ 2008 සහ 2009 වර්ෂවල ලංකා බැංකුව මගින් කොපමණ ණය මුදලක් ලබාදීමට සැලසුම්කර තිබේද;

(iv) ඉහත එක් එක් වර්ෂයේ වෙන වෙනම කොපමණ ණය මුදලක් ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ණය පොරොත්තු ලේඛනයේ සිටින රජයේ සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) 2008 වර්ෂය තුළ කොපමණ සංඛ්‍යාවකට, කොපමණ ණය මුදලක් ලබාදී අවසන් කර තිබේද;

(iii) මෙම වර්ෂය තුළ කොපමණ සංඛ්‍යාවකට ණය ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) රජයේ සේවකයින්ගේ විශාල සංඛ්‍යාවකට මෙම ණය ලබා ගැනීමට නොහැකිවීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0275/'09

2.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වාර්තාවලට අනුව රාජකාරී හා පුද්ගලික කටයුතු සඳහා වාහන පාවිච්චි කළ දුම්රිය දෙපාර්තමේන්තුවේ 4 දෙනෙකු 2006 ජුලි 14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2006 ට පටහැනිව තමන්ට හිමි ඉන්ධන සීමාව ඉක්මවා පාවිච්චි කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉන්ධන ලීටර් 6402 ක් වැඩිපුර පාවිච්චිකර ඇති එකී නිලධාරීන් කවුරුන්ද;

(ii) ඔවුන්ගේ රාජකාරී කවරේද;

(iii) සීමාව ඉක්මවා පාවිච්චි කළ ඉන්ධනවල මූල්‍ය වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0288/'09

3.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1996 වසරේ පළමු පන්තියට උසස්වීම් ලැබූ, දුම්රිය ස්ථානාධිපති කේ. සී. ඩබ්ලිව්. ආර්. ප්‍රනාන්දු මහතා ඇතුළු පිරිසකට වැටුප් වර්ධක 7ක විෂමතාවයක් ඇති බවත්;

(ii) මෙතෙක් එය නිවැරදි කිරීමට කටයුතුකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) 1994.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/94 හි 5. 3. 1. වගන්තිය හා 2/97 (iii) වැටුප් පරිවර්තනය නිවැරදිව ක්‍රියාත්මක නොකිරීමෙන් වැටුප් වර්ධක 2ක් අහිමිව සහ 1994.08.01 දින සිට 1999.11.11 දක්වා එකම වැටුපෙහි රැඳීසිටි මෙම පිරිසට රා. ප. ච. 7/2003 අනුව 1997, 1998 සහ 1999 වසර තුනට හිමි වැටුප් වර්ධක 3 ද අහිමිකර ඇත්තේ කෙසේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අයට වඩා වසර තුනකට පසු උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨත්වයෙන් වසර 3ක් අඩු නිලධාරීන්ගේ වැටුප අදාළ නිලධාරීන්ගේ වැටුපට වඩා වැටුප් වර්ධක 3ක් ඉහළට තබා ඇත්තේ කවර පදනමක් යටතේද;

(ii) මෙය රා. ප. ච. 11/94 උල්ලංඝණය කරමින් ජ්‍යෙෂ්ඨත්වය නොසලකා හැරීමක් නොවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0358/'09

4.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයන්හි පිහිටුවා ඇති "රැකියා පියස" ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එමඟින් විදේශ රැකියා සඳහා යොමු කිරීමට පැවති සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව කොපමණද;

(iii) එකී සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගිවූ අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ අතුරින් මේවනවිට රැකියා සඳහා විදේශගතවූ සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත විදේශ රැකියා සඳහා එක් අයෙකුගෙන් අය කළ මුදල කොපමණද;

(ii) මේ වනවිට මුදල් ගෙවා ඇති සංඛ්‍යාව හා ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා "ජොබ්ස් නෙට්" ආයතනය කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී තිබේද;

(ii) එහි කළමනාකාරවරු, අධ්‍යක්ෂ මණ්ඩලය සහ ලියාපදිංචි අංක කවරේද;

(iii) එය විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ ලියාපදිංචි වී තිබේනම් ලියාපදිංචි අංකය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0478/'09

5.

ගරු ජේමසිරි මානගේ මහතා,— නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඉතා දීර්ඝ කාලයක් තිස්සේ නැගෙනහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටි ධීවරයින් විශාල සංඛ්‍යාවක් එම ප්‍රදේශවලින් ත්‍රස්තවාදීන් විසින් පලවා හරිනු ලැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඔවුන්ගේ නිවාස, ධීවර යාත්‍රා සහ ආම්පන්න එම ත්‍රස්තවාදීන් විසින් සම්පූර්ණයෙන්ම විනාශ කළ බවත්;

(ii) දකුණට පැමිණි එම ධීවර පවුල් යළිත් එම ප්‍රදේශවල පදිංචි කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉහත "ආ (ii)" ප්‍රශ්නයට පිළිතුර "ඔව්" නම් ඊට අදාළව මෙතෙක් ගෙන තිබෙන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0488/'09

6.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ඇති ලියාපදිංචි වෙළෙඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වෙළෙඳසැල් අයිතිකරුවන් කවුරුන්ද;

(iii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) මෙම වෙළෙඳසැල් හිමියන් තෝරාගෙන ඇත්තේ කවර පදනමක් යටතේද;

(v) වෙළෙඳසැල් ලාභියෙකු වීමට ඔවුන්ට තිබූ මූලික සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට මෙම වෙළෙඳසැල් පවත්වාගෙන යන්නේ එහි මුල් අයිතිකරුවන් විසින්ද;

(ii) කිසියම් අයෙකුට පවරා තිබේනම්, ඒ කවුරුන්ගෙන් කවුරුන් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම වෙළෙඳසැල් අයිතිකරුවන් විසින් ගෙවිය යුතු මාසික බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) බදු මුදල් අයකර ගන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0500/'09

7.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 48 වැනි පිටුවේ (සිංහල මාධ්‍ය) යෝජනාකර ඇති පරිදි, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම මහා පරිමාණ කර්මාන්තයක් ඇතිවන ලෙස නව කර්මාන්තශාලා 300ක් පිහිටුවීම යටතේ මේවන විට ආරම්භකර ඇති මහා පරිමාණ කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කර්මාන්තශාලා සහ ඒවා ඉදිකරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0511/'09

8.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගා/ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පනංගල ගංගාරාම විහාරස්ථානය අසල ගිංගඟෙන් එතෙරවීම සඳහා පාලමකට මුල්ගල් තැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එවකට අග්‍රාමාත්‍යවරයා සහ මහාමාර්ග අමාත්‍යවරයා ලෙස සිටි වර්තමාන අතිගරු ජනාධිපතිතුමා එම මුල්ගල තැබූ බවත්;

(ii) එම මුල්ගල තබා මේ වනවිට අවුරුදු 05 ක් ගත වී තිබෙන බවත්;

(iii) ගංගාරාම විහාරස්ථානයේ ආගමික කටයුතු සිදුවන අවස්ථාවන්හිදී ගම්වාසින්ට ගඟෙන් එතෙරවීම සඳහාත්, පනංගල මහාබෝධි විදුහලට පැමිණෙන පාසල් දරුවන්ට ගඟෙන් එතෙරවීම සඳහාත්, මෙම පාලම අවශ්‍ය බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) කොපමණ කාලසීමාවක් තුළ මෙම පාලම සෑදීම ආරම්භ කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0533/'09

9.

ගරු රවි කරුණානායක මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 ජූලි 01 වැනි දින වන විට,

2002 ජූලි 01 වැනි දින වන විට,

1995 ජූලි 01 වැනි දින වන විට,

පළාත් මට්ටමින් සහ ජාතික මට්ටමින් ක්‍රියාත්මකව පැවති රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) අද වන විට සිටින වෛද්‍යවරු සංඛ්‍යාව වැටුප් ප්‍රමාණයන් සමග පළාත් මට්ටමින් සහ ජාතික මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රෝගීන් හා වෛද්‍යවරුන් අතර අනුපාතය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉකුත් වසර පහ තුළ වාර්ෂිකව රෝහල්වලට ඇතුළත් කළ රෝගීන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0128/'09

10.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුහුණු ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා යොමු කරවීමට රජයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ ක්‍රියාත්මක වන්නේ නම්, 2007, 2008 සහ 2009 වර්ෂයන්හි දී කොපමණ පුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාවක් රැකියා සඳහා විදේශගත වී තිබේද;

(iii) එය විදේශ රැකියා සඳහා පිටව යන අයගෙන් කවර ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) හෙදියන් පුහුණු කර විදේශ රැකියා සඳහා යොමු කිරීමට 2007 වර්ෂයේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන ලද බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ පුහුණු වැඩ පිළිවෙළක් ආරම්භ කළේ නම්, ඒ සඳහා කොපමණ මුදලක් වැය කර තිබේද;

(ii) 2007, 2008 සහ 2009 වර්ෂවලදී වෙන වෙනම පුහුණු හෙදියන් කොපමණ සංඛ්‍යාවක් විදේශ රැකියා සඳහා පිටව ගොස් තිබේද;

(iii) එම රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0362/'09

11.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කෑගල්ල දිස්ත්‍රික්කයට මෙවර යල් කන්නය වෙනුවෙන් දෙනු ලබන පොහොර සහනාධාරය සඳහා ඇණවුම් කරන ලද පොහොර වර්ග ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වගාකර මාසයකට ආසන්න කාලයක් ගතවී ඇතත් තවමත් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙත එම සහනාධාර පොහොර නිකුත් කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එලෙස ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙත පොහොර ලැබීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(ii) ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙත පොහොර ප්‍රවාහනය සඳහා ටෙන්ඩර් කැඳවීමක් කළේනම් ඒ කවදා ද;

(iii) පොහොර ප්‍රවාහනය බාර දෙනු ලැබුවේ කවුරුන් වෙතද;

(iv) එම ආයතනයේ නම හා ලිපිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නියමිත කාලයට ගොවීන් වෙත සහනාධාර පොහොර නොලැබීමෙන් සිදුවන අපහසුතාව වළක්වා ගැනීම සඳහාත්, වෙන් කරනු ලබන ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහාත් ගනුලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0480/'09

12\.
ගරු ජේමසිරි මානගේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වන විමර්ශන අංශය ස්ථාපිත කළේ කවදාද;

(ii) ආරම්භයේ සිට මේ දක්වා විමර්ශන අංශයට ලැබී තිබෙන මහජන පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) එම පැමිණිලි අතුරින් මේ වනවිට විභාගකර අවසන් වී තිබෙන හා විභාග වෙමින් පවතින පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙතෙක් විභාගයට ගෙන නොමැති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විභාග කිරීමෙන් පසුව දඬුවම්වලට ලක් වූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) මෙතෙක් විභාගයට ගෙන නොමැති පැමිණිලි විභාග කිරීම සඳහා කොපමණ කාලයක් ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0534/'09

13\.
ගරු රවි කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 ජූලි 01
2002 ජූලි 01
1995 ජූලි 01,
යන දිනයන්හි දී ක්‍රියාත්මකව පැවති පළාත් මට්ටමේ සහ ජාතික මට්ටමේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) අද වන විට සිටින ගුරුවරුන් සංඛ්‍යාව වැටුප් ප්‍රමාණයන් සමග පළාත් මට්ටමින් සහ ජාතික මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ගුරු සිසු අනුපාතය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පසුගිය වසර පහ තුළ වාර්ෂිකව පළමු ශ්‍රේණියට ඇතුළත් කළ ළමුන් සංඛ්‍යාව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0369/'09

14\.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත අරණායක විවිධ සේවා සමුපකාර සමිතියේ ජංගම ගිණුමේ අයිරාව කොපමණද;

(ii) දැනට මෙම සමුපකාර සමිතිය පවත්වාගෙන යනු ලබන ප්‍රධාන ගොඩනැගිල්ල බැංකුවට උකස්කර තිබේද;

(iii) ඒ කවර බැංකුවකට, කවර හේතුවක් නිසාද;

(iv) මෙම උකස්කරය මේ වනවිට බේරාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමිතියේ අගරු වන චෙක්පත් නැවත ලිවීම නිසා වන පාඩුව මාසිකව කොපමණද යන්න එතුමා දන්නෙහිද?

(ඇ) සමූපකාර සමිතියට අයත් ග්‍රාමීය බැංකු ශාඛා සංඛ්‍යාව හා එහි තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) සමිතියට අයත්ව තිබූ ඉන්ධන පිරවුම්හලේ සේවය කළ සේවකයින් 5 දෙනා වෙනත් කවර හෝ සේවාවක යොදවා නොමැති අතර ඔවුනට මාසිකව වැටුප් පමණක් ගෙවීම් කරනු ලබන බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0464/'09

15.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කොපමණ නගර සභා, ප්‍රාදේශීය සභා සංඛ්‍යාවක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එම එක් එක් පළාත් පාලන ආයතනයේ 2006, 2007, 2008 හා 2009 වර්ෂයන්හි ආරක්ෂණ ආදායම හා සාමාන්‍ය ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත පළාත් පාලන ආයතන ඉහත වර්ෂයන් තුළ රාජ්‍ය හෝ වෙනත් ආයතන වලින් ණය ලබාගෙන තිබේද;

(ii) එසේනම්, ණය ලබාගත් ආයතනය, ණය කොන්දේසි, ලබාගත් ණය මුදල හා එය යෙදවූ ව්‍යාපෘතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් පළාත් පාලන ආයතනය විසින් වාර්ෂිකව ගෙවීමට ඇති ණය මුදල් ප්‍රමාණය, ණය වාරිකය සහ පොලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0481/'09

16.

ගරු පේමසිරි මානගේ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004, 2005, 2006, 2007 සහ 2008 යන වර්ෂයන්ට අදාළව රාජ්‍ය බදු ආදායම හා බදු නොවන ආදායම රුපියල් මිලියන වලින් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වර්ෂයන්ට අදාළව රජයේ බදු ආදායම හා බදු නොවන ආදායම මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) බදු නොවන ආදායමට සාපේක්ෂව බදු ආදායම ඉහළ ගොස් තිබීමට හේතු කවරේද;

(iii) 2009 වසර තුළ රජය විසින් අලුතින් හඳුන්වාදෙන ලද බදු පනත් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.
සමාජසේවා හා සමාජ සුභසාධන අමාත්‍යතුමා,— මැතිවරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන),— මැතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා යම් තැනැත්තකු විසින් පූර්ණ දෘෂ්‍යාබාධිත තැනැත්තන්ව කැටුව යාමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම පිණිස ද; (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන මැතිවරණ ආඥාපනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1981 අංක 7 දරන ජනමත විචාරණ පනත, 1981 අංක 15 දරන ජනාධිපතිවරණ පනත සහ 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.
පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 01 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතුය.

3.
පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම පැවැත්වෙන කාලවේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතුය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතුය.

4.
පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2009.10.09 වැනි දින රැස්වීම පැවැත්වෙන කාලවේලා පූ. භා. 9.30 සිට අ. භා. 1.30 දක්වා විය යුතුය. අ. භා. 12.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතුය.

5.
ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

"රණ කලා ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

6.
ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

"ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යානවිද්‍යා ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද, සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2009 ඔක්තෝබර් මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා,— සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත යටතේ නියෝගය,— 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනතේ 11 වැනි වගන්තිය යටතේ කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා විසින් සාදනු ලැබ, 2009 මැයි මස 19 දින, අංක 1602/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.08.26 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*3.

ප්‍රවාහන අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ නියෝගය,— 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 46 (ඌ) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 44 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යතුමා විසින් පනවන ලදුව 2009 මැයි මස 29 දිනැති අංක 1603/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.09.10 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*4.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*10.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*11.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*13.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*14.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*15.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*16.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*17.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

කැළෑ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*20.

පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*21.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 123— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන එක්දහස් හත්සිය පහළොවකට (රු. 1,715,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 123 | — | නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන කාර්යයන් | |
| | ප්‍රාග්ධන වියදම් | රු. | 1,715,000,000 | |
| | | රු. | 1,715,000,000 | |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 සැප්තැම්බර් මස 24 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 14 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 13 දක්වා එකතුව රු. 20,780,903,938.

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*28.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*29.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*30.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*31.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*32.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*33.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*34.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ අතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*35.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

36.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.

ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

39.

පුලතිසි දරුවෝ පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

40.

සිරිනිවෙස් ප්‍රජාමිත්‍ර සහයෝගීතා කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

41.

හැම්ප්ටන් විලේජ් ශ්‍රී ලංකා භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

42.

මාළිගාවත්ත ජනාසා සහ සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

43.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

44.
ග්‍රාමීය සේවක සහ අනුබද්ධිත ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0116/'09

1.
ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ කලාප අංක 05 යටතට ගැණෙන අනුරාධපුර, පොළොන්නරුව, වව්නියාව, මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල සමාජ සුභසාධන ව්‍යාපෘති සඳහා 2006, 2007, 2008, 2009 යන වර්ෂයන්හිදී වෙන වෙනම කොපමණ මුදලක් වෙන්කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතීන්හී වැඩ අවසන්කර තිබේනම්, වැඩ ආරම්භ කළ දිනය, වැඩ අවසන් කළ දිනය, ඇස්තමේන්තුගත මුදල හා ගෙවා අති මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත ව්‍යාපෘති මගින් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2009 වර්ෂය සඳහා තෝරාගෙන ඇති ව්‍යාපෘති හා ඇස්තමේන්තු කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0117/'09

2.
ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ කලාප අංක 03 යටතට ගැනෙන කුරුණෑගල හා කෑගල්ල දිස්ත්‍රික්කවල සමාජ සුබසාධන ව්‍යාපෘති සඳහා 2006, 2007, 2008, 2009 යන වර්ෂයන්හිදී වෙන වෙනම කොපමණ මුදලක් වෙන්කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතීන්හී වැඩ අවසන්කර තිබේනම්, වැඩ ආරම්භ කළ දිනය, වැඩ අවසන් කළ දිනය, ඇස්තමේන්තුගත මුදල හා ගෙවා අති මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත ව්‍යාපෘති මගින් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2009 වර්ෂය සඳහා තෝරාගෙන ඇති ව්‍යාපෘති හා ඇස්තමේන්තු කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0462/'09

3\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 වර්ෂයේ සිට මේ දක්වා ඒ ඒ වර්ෂයේදී ආනයන අපනයන පාලකවරයා විසින් බදු සහන යටතේ ලබාදුන් වාහන ආනයන බලපත්‍ර සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) බලපත්‍රලාභීන්ගේ නම්, වාහනයේ වර්ගය හා වැසි අංක කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එම වාහන වල නිෂ්පාදිත වටිනාකම සහ වර්තමාන වෙළෙඳපොළ වටිනාකම කොපමණද;

(ii) මෙමඟින් අප රටට ලැබුණු බදු ආදායම කොපමණද;

(iii) අහිමි වූ බදු ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?